# යහ පාලනය සහ මෛත්‍රී පාලනය

**රංජිත් වීරසිංහ**




මෛත්‍රීපාල සිරිසේන මහතා අද ශ්‍රී ලංකාවේ විධායක බල සහිත ජනාධිපතිය. ඔහුගේ මැතිවරණ ව්‍යාපාරය තේමා කරගත්තේ " රටකට ඕනෑ මෛත්‍රී යුගයක්" යන ආකර්ශනීය පාඨයයි. සැබවින්ම එය ශ්‍රී ලාංකිකයන් ට ආමන්ත්‍රණය කිරීමට සුදුසු හා ගැලපෙන නිර්මාණයකි. බුදුදහමට අනුව තමන් වෛර නොකරන්නකු බව මෛත්‍රීපාල සිරිසේන මහතා නිරන්තරයෙන්ම ප්‍රකාශ කළේ ධම්ම පදයේ එන "නහී වේරේන වේරාණි..." යන ගාථා පාඨය උපුටා දක්වමිනි. තමාගේ නම ඡන්දදායකන්ට සිහිපත් කරන අතරම, ඔහුගේ මැතිවරණ පණිවිඩයද ඒ තුලම ගැබ් කළ " රටකට ඕනෑ මෛත්‍රී යුගයක්" ජනතා සිත්සතන් තුළ සෙමින් කිඳාබසිමින් පවතී. දැන් මැතිවරණය අවසන්ය. අප ජනාධිපතිගේ නම මන්ත්‍රයක් මෙන් මැතිරීමට අවශ්‍යතාවක් තවදුරටත් නැත, සියළු ශ්‍රී ලංකිකයෝ එය දනිති. එහෙත් රටකට ඕනෑ මෛත්‍රී යුගයක් යන්න අමතක වීමට ඉඩ නොහැරිය යුතුය.

ස්වකිය නාමය නිසා උපන් මෙම වචනය බුදුදහමේ එන මෛත්‍රී යන්නට සීමාකර ඉදිරියේදී රට පාලනය පටු සිමාවකට කොටුකිරීම ට අවස්ථාවාදීන් මාන බලන බවට දැනටමත් ඉඟි පහළවෙමින් ඇත. මෛත්‍රී යුගයක් යන්නෙන් අදහස් කළේ කුමක්දැයි දේශපාලන අර්ථයෙන් විග්‍රහ කරගත යුතුව ඇත. මෛත්‍රීපාල සිරිසේන නම් විධායක ජනාධිපතිට, තම තනතුරට අනුව ජනාධිපතිකෙනක් වශයෙන් මෛත්‍රිය පෙන්නුම් කළ හැකි අවස්ථා මොනවාදැයි සොයා දැනගැනීමට අපට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පරිශීලනය කළ හැකිය. ඔහුට හිරකරුවන්ට මෛත්‍රිය පා නිදහස් කළ හැකිය. එහෙත් ඔහුට නීතිපතිට හෝ අධිකරණය ට අණදීමට හැකියැයි කියවෙන වගන්ති අප ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙන බවක් දක්නට නැත. ඔහුට හමුදාවට හා පොලිසියට අණදිය හැකිය. අපරාධකරුවන් නීතියේ රැහැනට අසුකර ගැනීමට මුලික වන්නේ පොලිසියයි. අපරාධකරුවන් හෝ තෝරාගත් අපරාධකරුවන් අසුකරගැනීම සිදුකරන පරීක්ෂණ නවතා දමන්නැයි කියා ජනාධිපතිට පොලිසියට අණකළ හැකිද?. එසේ කළ හොත් එය මෛත්‍රී පාලනයක් වේද?

මෙම මැතිවරණයට පෙරාතුවම මාදොළුවාවේ සෝභිත ස්වාමින් වහන්සේ ප්‍රමුඛ බොහෝ මානව හිමිකම් ක්‍රියාධරයෝ යහපාලනයක අවශ්‍යතාව ගැන කරුණු ඉස්මතු කළහ. යහපාලනය හා මෛත්‍රී පාලනය අන්‍යොන්‍ය වශයෙන් බහිෂ්කරණය වු ක්‍රියාවලි දෙකක් නොවී යහපාලනය මෛත්‍රී පාලනය තුළින් අර්ථවත් වියයුතුය. යහපාලනයට මග අවුරණ කිසිම ක්‍රියාවක් මෛත්‍රිය යන වචනයට සිමාවී හෝ මුවාවී නොකළ යුතුය.

අද අප රටේ බොහෝ අපරාධකරුවෝ නිදැල්ලේ සිටිති. සමහර අපරාධ සිදුවන ආකාරය රූපවාහිනී තිරය තුළින් අපි සජීවීව දුටිමු. උසාවියෙන් වරෙන්තු නිකුත් කර ඇති පුද්ගලයන් පොලිසිය සමග ප්‍රසිද්ධියේ සිටිනු අපි දැක ඇත්තෙමු. මේවා යහපාලනය ඇති රටක දැකිය නොහැකි කරුණුය. අපරාධකරුවන් ඔවුන්ගේ තරාතිරම නොබලා නීතිය ඉදිරියට පැමිණ වීම යහපාලනයකට මුලපිරීමකි.

ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මුහුණදෙන මුලික හා බැරෑරුම් අභියෝගය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අවශ්‍යය තුනෙන් දෙකක පාර්ලිමේන්තු බහුතරය ලබා ගැනී මයි. දූෂිත පාලන ක්‍රමයකට පුහුණු කරන ලද බොහෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සිය පදවිය නීතියේ සහ සදාචාරයේ සිමා නොතකන ධනය උපයගැනිමට කේවල් කළ හැකි වෙළඳ භාණ්ඩයකි. මෙවන් මන්ත්‍රීවරුන් සිය ආණ්ඩුවේ ව්‍යවස්ථා සංශෝධනයට කැමති කර ගැනීමට ගෙවිය යුතු මිල යහ පාලනය විකුණා ලබාගෙන එයට මෛත්‍රී ලේබලය ඇලවීම නොකළයුත්තක් මෙන්ම නොසිදුවිය යුත්තකි .

ADVICE ON LEGAL MATTERS

**Business & Commercial Law**
Sale & Purchase of Busines | Leases | Franchises

**Conveyancing**
**Residential, Commercial & Rural**
Sale & Purchase | Vendor Statements
Auction Contracts | Contract of Sales
Subdivisions

**Probate & Testamentary**
Wills | Power of Attorney
(Foreign, Special, Enduring & Medical)
Deceased Estates & Administration

**Family Law**
Divorce | Consent Orders
Property Settlements | Binding Financial Agreements

**Migration Law**
General Skilled | ENS/RMS
Spouse | Contributory Parents
Visitor......etc

GATEWAY
LAWYERS

**Senanie Kurukularatne**
**Barrister & Solicitor**
Director-Principal
Attorney-at-Law Sri Lanka
Registered Migration Agent
MARN 0854193

**GATEWAY LAWYERS (AUSTRALIA) PTY LTD**
PO Box 730 Berwick VIC 3806 Australia
DX 30463 Berwick VIC 3806 Australia
**17 Glenview Rise Berwick VIC 3806 Australia**

**Tel** +61 3 8786 9682
**Fax** +61 3 8786 9681
**Mobile** +61 414 660 513

info@gatewaylawyers.com.au
www.gatewaylawyers.com.au